2022 ඔක්තෝබර් 28

ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති කාර්යාල ගොඩනැගිල්ල නිල වශයෙන් විවෘත කිරීමේ උත්සවය අවස්ථාවේ ජූලී ජේ. චංග් තානාපතිතුමිය විසින් සිදුකළ අදහස් දැක්වීම

නියෝජ්‍ය ධූතමණ්ඩල ප්‍රධානී ඩග් සොනෙක් මහත්මයාට ස්තුතියි. ශ්‍රී ලංකාවේ ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමනි, ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යවරුනි, ධූතමණ්ඩල හා එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන ප්‍රධානිවරුනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, සම්භාවනීය අමුත්තනි, එ.ජ. තානාපති කාර්යාලයේ සහෝදර නිලධාරිවරුනි,

ශ්‍රී ලංකාවේ නව එක්සත් ජනපද තානාපති කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම සැමරීම සඳහා අප සමගින් අද දින එක්වීම පිළිබඳව ඔබ සැමට ස්තුතියි, ඔබ සැමදෙනා මේ අවස්ථාවට සාදරයෙන් පිළිගන්නවා. මා කුඩා කල හැදී වැඩුනේ මුහුදට එතරම් දුරක් නැති දකුණු කැලිෆෝනියාවේ බව ඔබ බොහෝදෙනෙක් දන්නවා. අද සැන්දෑවේ අප හැමදෙනා දකින මේ සුන්දර මුහුදු තීරයේ දර්ශනය මට සිහිකර දෙන්නේ අප සියළුදෙනා ම එකිනෙකා සමගින් කොතරම් සම්බන්ධද කියායි. මේ, අපේ අළුත් නිවහනයි. මා මේ ගොඩනැගිල්ලට ආදරය කරනවා, මේ ගොඩනැගිල්ලට පය තබන සෑම දිනකම මේ කවුළු, ආලෝකය, චිත්‍ර, සහ මෙයින් පුද්ගලයින් එකට එක් කරන ආකාරය ගැන මා ස්තුතිවන්ත වනවා. මේ සඳහා සෑහෙන වෙහෙසක් දරන්නට වූවා- මට නම්, ඉන් ඉන් පිළිබිඹු වන්නේ මෙරට ජනතාව කෙරෙහි සහ ශ්‍රී ලංකාව සමගින් ඇති ද්වි පාර්ශවීය සබඳතාවය කෙරෙහි අපේ ඇති උනන්දුව සහ කැපවීම පිළිබඳ දැවැන්ත සාක්ෂියකුයි. මේ අවකාශය සැලසුම් කර එය ඉදිකරන්නට වෙහෙස වූ රාජ්‍ය දෙපාර්තමේන්තුව මුළුල්ලේ සිටින මගේ සහෝදර නිලධාරීන්ට සහ මෙරට ශිල්පීන්ට ස්තුතියි. ඔබ කළ මාහැඟි කාර්යයයට මා ගරු කරනවා, එය අගය කරනවා. සෑම දිනකම මාත්, මාගේ කණ්ඩායමත්, අප විසින් ඉටුකරන වැදගත් රාජ්‍යතාන්ත්‍රික මෙහෙවර හරහා ඊට සාධාරණයක් කිරීමට වෙහෙස දරනවා.

එක්සත් ජනපදයට සහ ශ්‍රී ලංකාවට වසර 70කට වඩා කාලයක් දිවෙන රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති බව ඔබ දන්නවාද? ඇත්තන්ම, අප දෙරට අතරේ නිල ද්වි පාර්ශවීය රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා ඇති කරගැනීමේ 74 වැනි සංවත්සරය හෙට දිනට යෙදී තිබෙනවා. තානාපති ශ්‍රීමත් ක්ලෝඩ් කුරේ 1948 ඔක්තෝබර් 29 වැනි දින වොෂින්ටන් ඩී.සී හි ලංකා තානාපති කාර්යාලය විවෘත කර වසරකටත් අඩු කාලයකින්, එනම් 1949 අගෝස්තු මාසයේදී ෆීලික්ස් කෝල් තානාපතිතුමා මෙරට පළමු එක්සත් ජනපද තානාපතිවරයා ලෙස අක්තපත්‍ර පිළිගැන්වූ බව ඉතිහාසය නිරීක්ෂණය කරන්නන්ට මතක ඇති. ඉන් පසුව ගතවූ දශක හත හමාරක කාලය තුළ වොෂින්ටන් හි සහ කොළඹ ඇති අපේ තානාපති කාර්යාල බොහෝ වෙනස්වීම් සඳහා සාක්ෂි දැරුවා. මට පෙර මේ ධූතමණ්ඩලයට නායකත්වය දුන් තානාපතීන් 27 දෙනෙක් සිටිනවා. ඒ කාලය මුළුල්ලේ අප වැඩකරන වේගය වඩාත් ශීඝ්‍ර වී තිබෙනවා, අපේ හවුල්කාරීත්වය වඩාත් පුළුල් වී තිබෙනවා. තානාපතිවරුන් සහ ඔවුන්ගේ කණ්ඩායම්වලට ඒ තනතුරුවල රැඳී සිටිය හැක්කේ කෙටි කාලයකට වුවත්, වැදගත්ම දේවල් වෙනස් වී නැහැ, එනම් අපේ මිත්‍රත්වයේ සහ හවුල්කාරීත්වයේ පදනම කාලයේ පරීක්ෂාවට සාර්ථකව මුහුණ දෙමින් දිනෙන් දින වර්ධනය වී තිබෙනවා.

අලංකාර ලෙස, හොඳින් සිතා බලා නිර්මාණය කරන ලද මේ ගොඩනැඟිල්ලේ සිට අපගේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් දෙක අතර ඇති ඉතිහාසය ආවර්ජනය කරමින්, අපගේ හවුල් සාර්ථකත්වය තවදුරටත් ඉදිරියට ගෙනයාමට පියවර ගැනීම සඳහා කැප වන මෙන් මා ඔබ සැම දිරිමත් දිරිමත් කරනවා. අද පැමිණ සිටින ඔබ සියලු දෙනාම අපගේ ද්විපාර්ශ්වික සබඳතාව ශක්තිමත් කිරීම වෙනුවෙන් පෙනී සිටින්නන් වන අතර ඒ එක් එක් තැනැත්තාට සුවිශේෂී වෙනසක් සිදුකළ හැකියි. ශ්‍රී ලංකාවේ ආයෝජන සහ වෙළඳ වාතාවරණය සහ එක්සත් ජනපදය සමඟ ඇති ද්විපාර්ශ්වික වෙළඳාම වේවා; දේශගුණික අර්බුදය හා ආහාර සුරක්ෂිතතාව සමගින් බැඳුණු පොදු අභියෝග සම්බන්ධයෙන් සාමූහික සහයෝගය; හෝ නීතියේ ආධිපත්‍යය, මාධ්‍ය නිදහස, සුරක්ෂිත සහ විවෘත මුහුදු වෙළෙඳ මාර්ග, සහ සියලු ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව සහ සමෘද්ධිය ඇතුළු අපගේ හවුල් ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයන් තහවුරු කිරීම වේවා,  අප හැමදෙනාම එක් වූ කල අපට වෙනසක් සිදුකළ හැකියි.

සෞභාග්‍යමත්, ප්‍රජාතන්ත්‍රවාදී, සුරක්ෂිත සහ ඔරොත්තුදෙනසුළු ශ්‍රී ලංකාවක් යන අපේ පොදු අරමුණ කරා ළඟා වීම සඳහා ඇමෙරිකානු රාජ්‍යතාන්ත්‍රිකයින් සහ විවිධ විෂයයන් සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික විශේෂඥයින්ගෙන් සැදුම්ලත්

මාගේ තානාපති කාර්යාල කණ්ඩායම කැපවී සිටිනවා. අපගේ එම පොදු අරමුණු ළඟා කරගැනීම සඳහා සෑම දිනකම අපි පුළුල් පරාසයක ද්වී පාර්ශවීය වැඩසටහන් සම්බන්ධයෙන් කටයුතු කරනවා. අප මේ නව ගොඩනැගිල්ලට මාරුවෙමින් සිටින අතරතුර පවා ජොෂ්ඨ එ.ජ. නිලධාරීන්හට සත්කාරකත්වය ලබාදෙමින් ද්වීපාර්ශවීය සම්බන්ධතා හා බැඳුනු ඒ වැදගත් කර්යයන් අප ඉටු කළා. එසේ පැමිණි අමුත්තන් අපට සුභ ආරංචි රැගෙන පැමිණීම අප ලැබූ භාග්‍යයක්. විශේෂයෙන්ම, මෙරට ආර්ථික ඉතිහාසය තුළ මුහුණ දෙන වඩාත්ම අභියෝගකාරී කාල පරිච්ඡේදය ගතකරමින් සිටින මේ කාලයේ ඒ සුභ ආරංචි ශ්‍රී ලංකාවට ඉතාමත් ප්‍රයෝජනවත් වේවි. පසුගිය මාසයේ ශ්‍රී ලංකාවට පැමිණි USAID පරිපාලකතුමිය වන සමන්තා පවර් මහත්මිය ගොවීන්ට පොහොර මිලදී ගැනීම සඳහා නව ආධාර වශයෙන් ලබාදෙන ඇ. ඩොලර් මිලියන 40ක් සහ මානුෂීය ආධාර වශයෙන් ලබාදෙන තවත් ඩොලර් මිලියන 20ක් පිළිබඳව නිවේදනය කළා. මේ ආධාර ලබාදෙන්නේ ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍යම පරිමාණ ගොවීන් වෙනුවෙන් ලබාදෙන ඩොලර් මිලියන 120ක මුල්‍යාකරණය, ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය වෙනුවෙන් ලබාදෙන ඩොලර් මිලියන 27, සහ ශ්‍රී ලංකාවේ වඩාත්ම අවදානම්පාත්‍ර ප්‍රජාවන් වෙත මානුෂීය, තාක්ෂණික, හා ආහාර සුරක්ෂිතතා සහන ලබාදීම සඳහා ලබාදෙන ඩොලර් මිලියන 30 ඉක්මවන මුදලට අමතරව යි. ඉහත නිවේදනවලට අමතරව, එක්සත් ජාතීන්ගේ ආහාර සංවිධානවල එක්සත් ජනපදය නියෝජනය කරන සින්ඩි මැකේන් තානාපතිතුමිය ද, අප විසින් ලබාදෙන ආධාරවල බලපෑම සියැසින්ම දැකබලාගැනීමට සහ මානුෂීය ආධාර වැඩසටහන්වල ප්‍රතිලාභීන් සහ ඒවා ක්‍රියාත්මක කරන්නන්ට සෘජුවම සවන්දීම සඳහා මෙරට චාරිකාවක නිරත වූවා. එමෙන්ම, පසුගිය සතියේ දී අපගේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ලේකම් ඩොන් ලූ මහතා මෙරට සංචාරයක නිරත වෙමින්, වැදගත් ඉන්දු ශාන්තිකර හවුල්කරුවකු වශයෙන් ශ්‍රී ලංකාවට අපේ සහයෝගය යළි තහවුරු කළා. අළුතින් නිවේදනය කළ ආධාර වත්මන් අර්බුදය හමුවේ අත්විඳින්නට වී ඇති දුෂ්කරතා මැඩලීම අරමුණු කරගෙන ලබා දී ඇති අතරම, ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන ආර්ථික වර්ධනය උදෙසා එක්සත් ජනපදය කැපවී සිටිනවා. තම ණය සාධාරණ ලෙස නැවත සාකච්ඡා කරගැනීමට සහ IMF ආධාර ලබාගැනීම සඳහා ඉදිරි මාර්ගය ගැනීමට ශ්‍රී ලංකාව දරන වෙහෙසට අප සහය දෙනවා. තවදුරටත් අප ශ්‍රී ලංකාවේ අපනයන භාරගන්නා විශාලතම වෙළඳපල ලෙස ක්‍රියාත්මක වෙමින් ශ්‍රී ලංකාවට නැවතත් තමන් දෙපයින් නැගී සිටීමට උපකාරී වන සේ රැකියා සහ විදේශ විනිමය උත්පාදනයට සහය දෙනවා.

සුහ ආරංචි එපමණකින් අවසාන වන්නේ නැහැ. ආර්ථික අර්බුදයේ අභියෝග තිබුනද, බාධාවකින් තොරව අඛණ්ඩව ඉදිරියට යන අපේ ද්වීපාර්ශවීය සාර්ථකත්වය සමරන්නට අපට පුළුවනි. ලබන මාසයේ එ.ජ.- ශ්‍රී ලංකා ෆුල්බ්‍රයිට් කොමිසම අප දෙරටේ සංස්කෘතීන් එකිනෙක යා කරමින් ශ්‍රී ලංකාවේ සහ එක්සත් ජනපදයේ ශාස්ත්‍රඥ දැනුම වඩාත් ශක්තිමත් කිරීමට දෙරට අතරේ සිදුවූ හුවමාරුවල 70 වර්ෂ සංවත්සරය සමරනවා. අද වන විට, අපගේ අධ්‍යාපනික හා සංස්කෘතික හුවමාරු වැඩසටහන්වල ආදි ශිෂ්‍යයන් වන ශ්‍රී ලාංකිකයින් 8,000 කට අධික සංඛ්‍යාවක් සිටින අතර තරුණ නායකයින් සහ සිසුන් තම අධ්‍යයන කටයුතු සහ වෘත්තීය අභිවෘද්ධිය සඳහා එක්සත් ජනපදයට ගොස් ඔවුන්ගේ සිහින ක්‍රියාවට නැංවීම සඳහා නැවත ශ්‍රී ලංකාවට පැමිණෙනවා. English Access නම් වූ අපගේ දෙවසර ශිෂ්‍යත්ව වැඩසටහන හරහා සෑම සතියකම ශ්‍රී ලාංකික ද්විතීයික පාසල් සිසුන් 150 කට අධික සංඛ්‍යාවක් සම්පූර්ණයෙන්ම නොමිලේ ඉංග්‍රීසි ඉගෙන ගන්නා අතර ඔවුන්ගේ ශ්‍රී ලාංකික ඉංග්‍රීසි ගුරුවරු ශිෂ්‍ය කේන්ද්‍රීය උපදේශන ශෛලීන් ඉගෙන ගනිමින් සිටිනවා. යාපනයේ, මහනුවර, මාතර සහ කොළඹ පිහිටි අපේ American Spaces වෙත පැමිණෙන විශ්වවිද්‍යාල සිසුන් හා යොවුන් පිරිස ඔවුන්ගේ ඉංග්‍රීසි දැනුම, ව්‍යවසායකත්ව කුසලතා, සංස්කෘතීන් අතර සන්නිවේදන කුසලතා, සහ විනිවිදභාවයත් සමානාත්මතාවයත් අගයන සර්වග්‍රාහි, විවිධත්වයෙන් යුත් සමාජයකට සහය දෙන වටිනාකම් සම්බධයෙන් වන විවිධ පාඨමාලා සහ ක්‍රියාකාරකම්වල නිරත වනවා.

70 වසරකට අධික කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ධනය කිරීමට, දේශීය ධාරිතාවය වැඩිදියුණු කිරීමට, සහ ශ්‍රී ලාංකීය ජනතාවගේ සෞභාග්‍ය හා සුබසෙත සඳහා සහය ලබාදීමට හවුල්කාරීත්වය, ආධාර සහ වෙළඳ අවස්ථා ලබාදෙමින් එක්සත් ජනපදය ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව කෙටියෙන් මෙසේ විස්තර කළ හැකියි. වචනයෙන් සහ ක්‍රියාවෙන් අපි මිතුරන් සහ හවුල්කරුවන් වනවා, අපගේ හවුල් අනාගතය සහ, වත්මන් අභියෝග සාර්ථකව මැඩපවත්වාගැනීම සම්බන්ධයෙන් මා බලාපොරොත්තු සහගතව පසුවනවා. ශුභවාදියකු වශයෙන් මා අපේ අනාගතයේ සාධනීය අවස්ථා ඇතැයි විශ්වාස කරනවා. එනිසා, අප හැමදෙනාම එක් වූ අද දින අපි බදාම සහ ගඩොලින් තැනූ, වීදුරු කවුළුවලින් ආලෝකය ලබන මේ ගොඩනැගිල්ල පමණක් නොව, එතුළ සිටින පුද්ගලයින්ගේ ජීවගුණය සමරමු. මේ නව පරිශ්‍රය ශ්‍රී ලංකාව සමගින් අපට ඇති හවුල්කාරීත්වය කෙරෙහි අපේ කැපවීම සහ

දුෂ්කර කාලවලදී අපේ සහයෝගය සිහිකරදෙන්නක් කරගනිමු. අපි ඉදිරියටත් එක්ව වැඩ කරමු. ස්තුතියි.